රාජ්‍ය පරිපාලන, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය

නැගීඑන කලාපවල ග්‍රාමීය යටිතල පහසුකම් සංවර්ධන ව්‍යාපෘතිය (RIDEP) ණය අංක SL-P116

ව්‍යාපෘති කාර්ය මණ්ඩල බඳවා ගැනීම

ශ්‍රී ලංකා රජය විසින් ජපන් ජාත්‍යන්තර සහයෝගිතා ආයතනයේ (JICA) මූල්‍යමය සහාය යටතේ ජපානයෙන් මිලියන 15,410 ක සම්පූර්ණ පිරිවැයක් සහිතව 2017 වසරේ සිට 2028 වසර දක්වා කාලය තුළ නැගී එන කලාපවල ග්‍රාමීය යටිතල පහසුකම් සංවර්ධන ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමට කටයුතු පිළියෙල කොට ඇති ව්‍යාපෘතියේ අරමුණ උතුරු, නැගෙනහිර, උතුරු මැද සහ ඌව පළාත් තුළ ග්‍රාමීය මාර්ග, මධ්‍යම හා කුඩා ප්‍රමාණයේ වාරිමාර්ග සහ පානයට යෝග්‍ය ජල සැපයුම් පහසුකම් වැනි මූලික යටිතල පහසුකම් වැඩි දියුණු කිරීම මගින් පළාත්බද ජනතාවගේ ජීවන තත්ත්වයන් ඉහළ නංවා ජීවිකාවන් සංවර්ධනය කිරීමය. ජපන ජාත්‍යන්තර සහයෝගිතා ආයතනයේ (JICA) මූල්‍යාධාර සමග මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමට බලය සහිත ප්‍රධාන ආයතනය රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශය වන අතර, මෙම ව්‍යාපෘතියෙහි ව්‍යාපෘති කළමනාකරණ ඒකකය (PMU) සහ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ ඒකකය (PIUs) සඳහා කාර්ය මණ්ඩල සාමාජිකයින් බඳවා ගැනීම පිණිස අංක 01/2019 හා 05.03.2019 දාතම් දරන කළමනාකරණ සේවා චක්‍රලේඛය පරිදි අමාත්‍යාංශය විසින් අයදුම්පත් කැඳවනු ලැබේ. ව්‍යාපෘතියේ පහත සඳහන් තනතුරු පිරවීම සඳහා පහත දක්වා ඇති සුදුසුකම් හා පළපුරුද්ද සහිත ශ්‍රී ලාංකික පුරවැසියන් වෙතින් අයදුම්පත් කැඳවේ.

අංකය	තනතුර	තනතුරු ගණන	වැටුප් මට්ටම	වැටුප් පරිමාණය (+රජයේ අනුමත දීමනා)
කොළඹ - ව්‍යාපෘති කළමනාකරණ ඒකකයට (PMU) කාර්ය මණ්ඩල බඳවා ගැනීම				
01	නියෝජ්‍ය ව්‍යාපෘති අධ්‍යක්ෂ	01	PS2	රු. 165,000.00 - රු. 185,000.00
02	ජ්‍යෙෂ්ඨ ඉංජිනේරු / ප්‍රසම්පාදන විශේෂඥ	01	PS3	රු. 160,000.00 - රු. 175,000.00
03	පාරිසරික හා ප්‍රජා සංවර්ධන විශේෂඥ	01	PS 3	රු. 160,000.00 - රු. 175,000.00
04	ව්‍යාපෘති ගණකාධිකාරී	01	PS4	රු. 135,000.00 - රු. 150,000.00
05	ගිණුම් සහකාර	02		අංක 01/2019 හා 05.03.2019 දාතම් දරන කළමනාකරණ සේවා චක්‍රලේඛය පරිදි
06	රියදුරු	02		
07	කාර්යාල සහකාර	02		
උතුරු / නැගෙනහිර/ උතුරු මැද/ ඌව පළාත් ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ ඒකක (PIUs) වලට කාර්ය මණ්ඩල බඳවා ගැනීම.				
08	ව්‍යාපෘති ගණකාධිකාරී	04	PS4	රු. 135,000.00 - රු. 150,000.00
09	ඉංජිනේරු / අනුමත නිලධාරී Engineer Cumcom Pliance Officer	04	PS 4	රු. 135,000.00 - රු. 150,000.00
10	කාර්මික නිලධාරී (පානයට යෝග්‍ය ජලය)	04	PS6 A ප්‍රභේදය	රු. 84,000.00 - රු. 89,000.00

1. නියෝජ්‍ය ව්‍යාපෘති අධ්‍යක්ෂ (PS2) - තනතුරු 01 (PMU) කොළඹ

1. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව පිළිගත් අදාළ ක්ෂේත්‍රයේ (සිවිල් ඉංජිනේරු) සාර්ථකව නිමා කළ ප්‍රථම උපාධිය

හෝ

අදාළ ක්ෂේත්‍රයේ (සිවිල් ඉංජිනේරු) උපාධියට සමාන සුදුසුකමක් ලෙස විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව පිළිගත් සුදුසුකමක්

හෝ

අදාළ ක්ෂේත්‍රයේ (සිවිල් ඉංජිනේරු) පිළිගත් වෘත්තීය ආයතනයකින් ලබාගත් සංයුක්ත සාමාජිකත්වය/ සමාන වෘත්තීය සුදුසුකමක්.

සමග

ජ්‍යෙෂ්ඨ කළමනාකරණ මට්ටමේ වසර 03 ක් සහිත කළමනාකරණ මට්ටමේ අවම තරමින් වසර 18 ක පශ්චාත් සුදුසුකම් පළපුරුද්ද. ශ්‍රී ලංකා ඉංජිනේරු ආයතනයේ සභාවේ සාමාජිකයකු විය යුතුය.

2. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව පිළිගත් අදාළ ක්ෂේත්‍රයේ (සිවිල් ඉංජිනේරු) සාර්ථකව නිමකළ ප්‍රථම උපාධිය

හෝ

අදාළ ක්ෂේත්‍රයේ (සිවිල් ඉංජිනේරු) උපාධියට සමාන සුදුසුකමක් ලෙස විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව පිළිගත් සුදුසුකමක්

සහ

අදාළ ක්ෂේත්‍රයේ (සිවිල් ඉංජිනේරු) පිළිගත් වෘත්තීය ආයතනයකින් ලබාගත් ආයතනික/ චාර්ටර්ඩ් සාමාජිකත්වය හෝ සමාන වෘත්තීය සුදුසුකමක්

හෝ

ශ්‍රී ලංකා ඉංජිනේරු සභාවේ සාමාජිකයකු විම.

හෝ

ජ්‍යෙෂ්ඨ කළමනාකරණ මට්ටමේ වසර 05 ක් සහිත කළමනාකරණ මට්ටමේ අවම තරමින් වසර 11 ක පශ්චාත් සුදුසුකම් පළපුරුද්දක් අවශ්‍ය වන අදාළ ක්ෂේත්‍රයේ (සිවිල් ඉංජිනේරු) පශ්චාත් උපාධියක්.

3. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව පිළිගත් අදාළ ක්ෂේත්‍රයේ (සිවිල් ඉංජිනේරු) සාර්ථකව නිමකළ ප්‍රථම උපාධිය හෝ අදාළ ක්ෂේත්‍රයේ (සිවිල් ඉංජිනේරු) උපාධියට සමාන සුදුසුකමක් ලෙස විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව පිළිගත් සුදුසුකමක්

සහ

අදාළ ක්ෂේත්‍රයේ පශ්චාත් උපාධියක්

සහ

අදාළ ක්ෂේත්‍රයේ (සිවිල් ඉංජිනේරු) පිළිගත් වෘත්තීය ආයතනයකින් ලබාගත් ආයතනික/ චාර්ටර්ඩ් සාමාජිකත්වය හෝ සමාන වෘත්තීය සුදුසුකමක්

සමග

ජ්‍යෙෂ්ඨ කළමනාකරණ මට්ටමේ වසර 04 ක් සහිත කළමනාකරණ මට්ටමේ අවම තරමින් වසර 09 ක පශ්චාත් සුදුසුකම් පළපුරුද්ද, ශ්‍රී ලංකා ඉංජිනේරු සභාවේ සාමාජිකයකු විම.

4. රජයේ දීප ව්‍යාප්ත සේවයේ I වන ශ්‍රේණියේ නිලධාරියකු හෝ අදාළ ක්ෂේත්‍රයේ (සිවිල් ඉංජිනේරු) සමාන තනතුරක් දැරීම.

සමග

I වන ශ්‍රේණියේ තනතුරක අවම තරමින් වසර 05 ක පළපුරුද්ද, ශ්‍රී ලංකා ඉංජිනේරු සභාවේ සාමාජිකයකු විම.

- විදේශ ආධාරලත් ව්‍යාපෘති පිළිබඳ පළපුරුද්ද සහිත අයට ප්‍රමුඛතාවය හිමිවේ.
- ග්‍රාමීය මාර්ග හා වාරිමාර්ග පළපුරුද්ද සහිත විම අමතර වාසියක් වනු ඇත.

2 හා 3 ජ්‍යෙෂ්ඨ ඉංජිනේරු / ප්‍රසම්පාදන විශේෂඥ (PS3) තනතුරු 01 පාරිසරික හා ප්‍රජා සංවර්ධන විශේෂඥ (PS3) - තනතුරු 01 (PMU) - කොළඹ

1. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව පිළිගත් අදාළ ක්ෂේත්‍රයේ සාර්ථකව නිමා කළ ප්‍රථම උපාධියක්

හෝ

අදාළ ක්ෂේත්‍රයේ උපාධියට සමාන සුදුසුකමක් ලෙස විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව පිළිගත් සුදුසුකමක්.

හෝ

අදාළ ක්ෂේත්‍රයේ පිළිගත් වෘත්තීය ආයතනයකින් ලබාගත් සංයුක්ත සාමාජිකත්වයක්/ සමාන වෘත්තීය සුදුසුකමක්

සමග

ජ්‍යෙෂ්ඨ ඉංජිනේරු තනතුර සඳහා වසර 12 ක කළමනාකරණ මට්ටමේ පශ්චාත් සුදුසුකම් පළපුරුද්ද ශ්‍රී ලංකා ඉංජිනේරු සභාවේ සාමාජිකයකු විම.

2. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව පිළිගත් අදාළ ක්ෂේත්‍රයේ සාර්ථකව නිමකළ පශ්චාත් උපාධියක්

හෝ

අදාළ ක්ෂේත්‍රයේ උපාධියට සමාන සුදුසුකමක් ලෙස විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව පිළිගත් සුදුසුකමක්

හෝ

අදාළ ක්ෂේත්‍රයේ පිළිගත් වෘත්තීය ආයතනයකින් ලබාගත් ආශ්‍රිත සාමාජිකත්වය/ සමාන වෘත්තීය සුදුසුකමක්.

සහ

අදාළ ක්ෂේත්‍රයේ පිළිගත් වෘත්තීය ආයතනයකින් ලබාගත් පශ්චාත් උපාධියක් හෝ ආයතනික / චාර්ටර්ඩ් සාමාජිකත්වය හෝ සමාන වෘත්තීය සුදුසුකමක්

සමග

ජ්‍යෙෂ්ඨ ඉංජිනේරු තනතුර සඳහා කළමනාකරණ මට්ටමේ අවම තරමින් වසර 09 ක පශ්චාත් සුදුසුකම් පළපුරුද්ද, ශ්‍රී ලංකා ඉංජිනේරු සභාවේ සාමාජිකයකු විම.

3. රජයේ දීපව්‍යාප්ත සේවයේ I වන ශ්‍රේණියේ නිලධාරියෙකු විම හෝ අදාළ ක්ෂේත්‍රයේ සමාන තනතුරක් දැරීම.

සමග

I වන ශ්‍රේණියේ තනතුරක අවම තරමින් වසර 04 ක පළපුරුද්ද ජ්‍යෙෂ්ඨ කළමනාකරණ තනතුර සඳහා ශ්‍රී ලංකා ඉංජිනේරු සාමාජිකයකු විම.

- විදේශ ආධාරලත් ව්‍යාපෘති පිළිබඳ පළපුරුද්ද සහිත අයට ප්‍රමුඛතාවය හිමිවේ.
- ග්‍රාමීය මාර්ග හා වාරිමාර්ග පළපුරුද්ද සහිත විම අමතර වාසියක් වනු ඇත.

4 හා 8 ව්‍යාපෘති ගණකාධිකාරී (PS4) - තනතුරු 05 - (PMU) - කොළඹ / PIUs (උ.ප./ නැ.ප./ උ.මැ.ප. හා ඌව)

1. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව පිළිගත් අදාළ ක්ෂේත්‍රයේ (ගිණුම්) සාර්ථකව නිමා කළ ප්‍රථම උපාධිය

හෝ

අදාළ ක්ෂේත්‍රයේ උපාධියට සමාන සුදුසුකමක් ලෙස විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව පිළිගත් සමාන සුදුසුකමක්

හෝ

අදාළ ක්ෂේත්‍රයේ පිළිගත් වෘත්තීය ආයතනයකින් ලබාගත් ආශ්‍රිත සාමාජිකත්වය/ සමාන වෘත්තීය සුදුසුකමක්

සමග

අදාළ ක්ෂේත්‍රයේ අවම තරමින් වසර 08 ක පශ්චාත් සුදුසුකම් පළපුරුද්ද.

2. රජයේ දීප ව්‍යාප්ත සේවාවේ iii/ii පෙළ හෝ ඉහළ නිලධාරියකු විම හෝ අදාළ ක්ෂේත්‍රයේ සමාන තනතුරක් දැරීම.

- විදේශ ආධාරලත් ව්‍යාපෘති පිළිබඳ පළපුරුද්ද සහිත අයට ප්‍රමුඛතාවය හිමිවේ.
- පරිගණක ගිණුම්කරණ මෘදුකාංග (QuickBooks වැනි) පිළිබඳ නිපුණතා අමතර වාසියක් වනු ඇත.

5. ගිණුම් සහකාර - තනතුර 02, (PMU) - කොළඹ

අවම අධ්‍යාපන සුදුසුකම් සහ පළපුරුද්ද

ඉංග්‍රීසි සහ සිංහල/ දෙමළ භාෂාව ඇතුළුව සම්මත සාමාර්ථ (03) තුනක් සමග අ.පො.ස (සා/ පෙළ) විභාගය විෂයයන් හයකින් (06) සමත්වීම සහ අ.පො.ස. (උ/පෙළ) විභාගය වාණිජ්‍ය විෂයයන් තුනකින් (03) සමත්වීම.

සහ

විදේශ ආධාරලත් ව්‍යාපෘතිවල ගිණුම් සහකාරවරයෙකු ලෙස වසර 03 ක හෝ ඊට වැඩි කාලයක පළපුරුද්ද, MS- Office පැකේජ සහ පරිගණක පාදක ගිණුම්කරණ පද්ධතිය පිළිබඳ දැනුම අවශ්‍ය වේ.

6. රියදුරු - තනතුරු 02 (PMU) - කොළඹ

අවම අධ්‍යාපන සුදුසුකම් සහ පළපුරුද්ද

සම්මත සාමාර්ථ දෙකක් සහිතව අ.පො.ස (සා/ පෙළ) විභාගය එක්වරකදී විෂයයන් 06 කින් සමත්වීම සහ මෝටර් වාහන දක්ෂතාවය සමග වලංගු රියදුරු බලපත්‍රයක් තබා ගැනීම.

සහ

විදේශ ආධාරලත් ව්‍යාපෘතියක රියදුරෙකු වශයෙන් වසර 03 ක අවම පළපුරුද්ද.

රාජකාරී සහ වගකීම්

ව්‍යාපෘතියේ වාහන ඉතා හොඳ තත්ත්වයෙන් නඩත්තු කර පවත්වාගෙන යාම.

7. කාර්යාල සහකාර - තනතුරු 02 (PMU) - කොළඹ

අවම අධ්‍යාපන සුදුසුකම් හා පළපුරුද්ද

සම්මත සාමාර්ථ 02 ක් සහිතව අ.පො.ස. (සා/ පෙළ) විභාගය එක්වරකදී විෂයයන් 06 කින් සමත්වීම

විදේශ ආධාරලත් ව්‍යාපෘතියක අවම වශයෙන් වසර 03 ක පළපුරුද්ද.

9. ඉංජිනේරු/ අනුමත නිලධාරී - (PS4) තනතුරු 04 PIUs (උ.ප., නැ. ප., උ. මැ.ප. & ඌව)

1. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව පිළිගත් අදාළ ක්ෂේත්‍රයේ (සිවිල් ඉංජිනේරු) සාර්ථකව නිමකළ ප්‍රථම උපාධියක්

හෝ

අදාළ ක්ෂේත්‍රයේ (සිවිල් ඉංජිනේරු) උපාධියට සමාන සුදුසුකමක් ලෙස විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව පිළිගත් සුදුසුකමක්

හෝ

අදාළ ක්ෂේත්‍රයේ (සිවිල් ඉංජිනේරු) පිළිගත් වෘත්තීය ආයතනයකින් ලබාගත් ආශ්‍රිත සාමාජිකත්වය/ සමාන වෘත්තීය සුදුසුකමක්

සමග

අදාළ ක්ෂේත්‍රයේ (සිවිල් ඉංජිනේරු) අවම තරමින් වසර 08 ක පශ්චාත් සුදුසුකම් පළපුරුද්ද

ශ්‍රී ලංකා ඉංජිනේරු සභාවේ සාමාජිකයකු විම.

2. රජයේ දීප ව්‍යාප්ත සේවයේ iii/ii හෝ ඉහළ පංතියේ නිලධාරියෙකු විම හෝ අදාළ ක්ෂේත්‍රයේ (සිවිල් ඉංජිනේරු) සමාන තනතුරක් දැරීම.

සමග

iii/ii පංතියේ තනතුරක අවම තරමින් වසර 08 ක පළපුරුද්ද, ශ්‍රී ලංකා ඉංජිනේරු සභාවේ සාමාජිකයකු විම.

- විදේශ ආධාරලත් ව්‍යාපෘතිවල පළපුරුද්ද සහිත අයට ප්‍රමුඛතාවය හිමිවේ.
- ග්‍රාමීය මාර්ග සහ වාරිමාර්ග පිළිබඳ පළපුරුද්ද සහිත විම අමතර වාසියකි.

10. කාර්මික නිලධාරී - (බීමට යෝග්‍ය ජලය) - PS6 ප්‍රභේදය A) තනතුරු 04 - PIUs (උ.ප. නැ.ප, උ.මැ.ප හා ඌව)

තෘතීය හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව පිළිගත් කාර්මික / වෘත්තීය අධ්‍යාපන ආයතනයකින් නිකුත් කළ ජාතික වෘත්තීය සුදුසුකම් මට්ටම 5 ට නොඅඩු නිපුණතා සහතිකයක් කාර්මික ක්ෂේත්‍රයට සම්බන්ධව තනතුරකට ලබා තිබීම.

සහ

අධ්‍යාපන විශේෂඥතා පරාසයේ අවම තරමින් වසර 15 ක පළපුරුද්ද.

- විදේශ ආධාරලත් ව්‍යාපෘතිවල පළපුරුද්ද සහිත අයට ප්‍රමුඛතාවය හිමිවේ.
- පානීය ජලය පිළිබඳ පළපුරුද්ද සහිත විම අමතර වාසියකි.

පොදු කොන්දේසි :

- තෝරා ගැනීමේ ක්‍රමවේදය සුදුසුකම් හා පළපුරුද්ද මත පදනම්ව කෙටි ලැයිස්තු ගත කළ අයදුම්කරුවන් සම්මුඛ පරීක්ෂණයට කැඳවනු ලැබේ.

වයස : අංක 01/2019 හා 2019.03.05 දාතම් දරන කළමනාකරණ සේවා චක්‍රලේඛය පරිදි වේ.

- සේවකයාගේ අර්ථසාධක (EPF) දායකත්වය 8% ක්ද, සේවායෝජක EPF දායකත්වය 12% ක්ද වන අතර, ETF දායකත්වය මාසික වැටුපෙන් 3% කි.
- සේවා නියුක්තිය පිළිබඳ නියමයන් : ව්‍යාපෘතිය පවතින කාලසීමාව, තනතුරෙහි අවශ්‍යතාවය සහ සතුටුදායක කාර්ය සාධනය මත පදනම්ව වාර්ෂිකව කොන්ත්‍රාත් පදනම මත සේවා දිගුවක් සඳහා පහසුකම් සහිතව සියලු පත්වීම් මුලිකව එක් වසරක් සඳහා කොන්ත්‍රාත් පදනම මත සිදු කෙරේ.
- රාජ්‍ය අංශයේ හෝ රාජ්‍ය සංස්ථාවල සේවයේ නියුතු නිලධාරීන් ඔවුන්ගේ අදාළ ආයතන ප්‍රධානීන් මගින් තම අයදුම්පත් ඉදිරිපත් කළ යුතුය. මේ පිළිබඳ උනන්දුවක් දක්වන අය, අදාළ අධ්‍යාපන සුදුසුකම් හා පළපුරුද්ද පිළිබඳ සහතිකවල පිටපත් සමග තම ජීව දත්ත 2021 පෙබරවාරි 28 දින ප.ව. 3.00 හෝ ඊට පෙර කොළඹ 07, ඉන්ඩිපෙන්ඩන්ස් චතුරශ්‍රය, අංක 330, රාජ්‍ය පරිපාලන, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශයේ, ලේකම් වෙත ලියාපදිංචි තැපෑලෙන් ලැබෙන්නට සැලැස්විය යුතුය.

විමසීම් : ලිපි කවරයේ වම් ඉහළ කෙළවරේ තනතුරෙහි නාමය සඳහන් කළ යුතුය.

ලේකම්,
රාජ්‍ය පරිපාලන, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය.